# පුරාතන ලංකාවේ සාංඝික දේපළ ආරක්ෂා කිරීම උදෙසා පරිහාර ලේඛනවල අන්තර්ගත සංකේත මගින් සිදු කළ බලපෑම පිළිබඳ විමසුමක්

*යූ.එල්.එන්.එස්. දයාරත්න [1]*

සාංඝික දේපළ හා විවිධ පරිහාර දීමනා ඇතුළත් අත්තාණි කණු ශිලා ලේඛන මූලාශ්‍රය තුළ අන්තර්ගත වන්නේ කිසියම් රජකුගේ ආඥාවට අනුව රාජ සභාවට අයත් රජයේ උසස් නිලධරයකු විසින් යම් පුද්ගලයකුට හෝ ආයතනයක් වෙත ප්‍රදානය කරනු ලබන සුවිශේෂී වරප්‍රසාද, අයිතිවාසිකම් ආදිය හා ඒවා සුරක්ෂිත කරගත යුතු ආකාරය පිළිබඳව මෙන් ම නීති උල්ලංඝනය කරන අයට ලබා දෙන දඬුවම් ආදිය යි. අත්තාණි කණුවල එන ශිලා පාඨවලට ඉහළින්, පහළින් මෙන් ම ශිලා ලේඛනයේ දෙපැත්තෙහි මෙන් ම ඇතැම් විටෙක සතර පැත්තෙහි ම හිරු, සඳු, බලු, කපුටු, නාග, වටාපත වැනි විවිධ සංකේත සලකුණු කොට තිබේ. අත්තානි කණු ශිලා ලේඛනවල ඉහත සඳහන් කළ සංකේත භාවිත කළ ඇති ආකාරය ත්, ඒවා යෙදීමෙන් අපේක්ෂා කළේ කුමක් ද යන්න ත් විමසා බැලීම මෙම පර්යේෂණයේ අරමුණ යි. පුරාතන ලංකාවේ සාංඝික දේපළ ආරක්ෂා කිරීම උදෙසා අත්තානි පරිහාර ලේඛනවල අන්තර්ගත සංකේත මගින් සිදු කළ බලපෑම කෙබඳු ද යන්න මෙහි ගැටලුව වේ . මෙම පර්යේෂණය ඓතිහාසික පර්යේෂණ ක්‍රමවේදයට කේන්ද්‍රගත වන අතර බුද්දන්නෙහෙල, මොරගොඩ, ඇල්ලේවැව, අයිතිගේවැව, කොන්ගොල්ලෑව ආදි අත්තානි කණු ශිලාලේඛන මූලාශ්‍රයට මූලිකත්වය දෙමින් කරුණු එක්රැස් කරන අතර එම මූලාශ්‍රයයේ එන කරුණු ත්‍රිපිටක සාහිත්‍යයේ හා බ්‍රාහ්මී ශිලාලේඛන වැනි මූලාශ්‍රය තොරතුරු සමග සංසන්දනාත්මක ව විමසුමට ලක් කෙරේ. ආරාම ආශ්‍රිත පරිහාර ප්‍රදානයන්හී දී විශේෂයෙන් ම මෙම දේපළ සාංඝික දීමනාවක් යැයි තහවුරු කිරීමට වටාපත සංකේතාත්මක ව භාවිත කෙරූ බවක් දක්නට පුළුවන. මෙම අත්තානි කණු ලිපි අතර බල්ලන් හා කපුටන්ගේ සංකේත වැඩි වසයෙන් පැවතීම මගින් පරිත්‍යාග කරන ලද සාංඝික හෝ පෞද්ගලික දේපළ සොරකම් කිරීම මහත් පාපිෂ්ඨ ක්‍රියාවක් වන බවත්, එලෙස සොරකම් කළ හෝ පැහැර ගැනීම මතු භවයන් හි බල්ලන් කපුටන් ව ඉපදීමට හේතු සාධක වන බව එයින් කියැවේ. බුදුදහමට අනුව මිනිසා එවැනි සත්ත්ව ආත්ම අපේක්ෂා කරන්නේ නැත. එසේ වන්නේ නම් එය දුක්ඛිත උප්පත්තියකි. බුද්දන්නෙහෙල ලිපියේ දී සුනඛ සංකේතය යොදා ඇත්තේ කරපටි සහිතව ය. දුන්න හා ඊතල, හෙණ්ඩුව හා හක්ගෙඩිය වැනි සංකේත මෙම ශිලා ලේඛනවල භාවිත කිරීමෙන් පෙන්නුම් කරනුයේ දේපළ පරිත්‍යාග කරන ලද ස්ථානවලට ඇත්ගොව්වන්ට, අස්ගොව්වන්ට හා හේවායන්ට ඇතුළත් වීමට අවසර නොමැති බව ය. ඇතැම් අත්තාණි කණුවල ඉර-හඳ වැනි සංකේත භාවිත කර ඇති අතර එයින් කියැවෙන්නේ මේ කියනු ලබන දීමනා ඉර-හඳ පවතින තාක් පවතින බව ත් ඒවා කිසිසේත් වෙනස් නොකළ යුතු බවත් ය. මේ කියනු ලබන දීමනා කවරකු විසින් හෝ විනාශ කරන්නේ ද, පැහැර ගන්නේ ද, බලහත්කාරයෙන් භුක්ති විඳින්නේ ද හේ සසර තුළ දුක්ඛිත ආත්ම සහිත ව උපදින්නේ යැයි පෙන්වා දී තිබේ. සාංඝික දේපළෙහි සුරක්ෂිතතාව සඳහා රජය රාජ්‍ය නීතියත්, ආගමික සංකල්පත් භාවිත කිරීමට කල්පනා කර ඇති බවක් පෙනී යයි. අත්තානි කණුවල දී ක්‍රියාවට නැංවූ මෙම ක්‍රමවේදය බොහෝ විට සාර්ථක වූ වැඩපිළිවෙළක් ලෙස පෙන්වා දිය හැකි ය. අත්තාණි කණු මගින් තත්කාලීන සමාජය තුළ මුල් බැසගත් විවිධ අදහස් පිළිබඳ ව අවබෝධයක් ලබා ගත හැකි ය. අත්තාණි කණු වල කරුණු දැක්වීමේ දී ආරම්භයේ හා අවසානයේ යහපත නිරෝගී බව සහ සෞභාග්‍ය ආදිය ප්‍රාර්ථනා කොට ඇත. එමෙන් ම පරිත්‍යාග කරන ලද සාංඝික හෝ පෞද්ලික දෙය සොරකම් කිරිම මහත් පාපිෂ්ඨ ක්‍රියාවක් බවට සමාජ මතයක් පැවති බව අධ්‍යයනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** අත්තාණි, දීමනා, රාජ ආඥා, සංකේත, සාංඝික

[1] ඉතිහාස අධ්‍යයනාංශය කැළණිය විශ්වවිද්‍යාලය. shashikalanuwanthi118@gmail.com